# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2115/12 - 2019 මාර්තු මස 18 වැනි සඳුදා - 2019.03.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

ජනා.කා.අංකය : පීඑස්/සීඑස්ඒ/00/9/6/1/4.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන් විසිනි**

මුද්‍රාව

මෛත්‍රීපාල සිරිසේන

### ජනාධිපති විධානය

යහපත් වූ රාජ්‍ය පාලනයක් තුළ ජනතාවගේ අභිලාෂයන් යථා පරිදි මුදුන්පත් කිරීම උදෙසා රාජ්‍ය සේවයේ කාර්යක්ෂමතාවය, ඵලදායිතාවය ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් සමස්ත රාජ්‍ය අංශයෙහි වැටුප්, වේතන ඇතුළු සියලු පාරිශ්‍රමික ව්‍යුහයන් සමාලෝචනය කරමින් සමස්ත රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශයේ ද ශ්‍රමබල අවශ්‍යතාවයන් යෝග්‍ය පරිදි සපුරාලීම පහසුකරලීම සඳහා කාර්ය මණ්ඩල අධ්‍යයනයක් සිදුකොට ඊට උචිත වනසේ ජාතික වැටුප් ප්‍රතිපත්තියක් සකස් කිරීම සහ එය ක්‍රියාත්මක කිරීම සඳහා රජයට උපදෙස් ලබා දීම සහ සහාය වීම පිණිස ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාව ප්‍රකාරව අතිගරු ජනාධිපතිතුමා විසින් තමා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින් විශේෂ නියෝජිතායතනයක් ස්ථාපනය කිරීම.

1. එස්. රනුග්ගේ මැතිතුමා
2. සී. පී. සිරිවර්ධන මැතිතුමා
3. දමිතා ද සොයිසා මැතිතුමිය
4. ලලිත් කන්නන්ගර මැතිතුමා
5. ජනක සුගතදාස මැතිතුමා
6. චිත්‍රාංගනී වාගීස්වර මැතිතුමිය
7. චන්ද්‍රාණි සේනාරත්න මැතිතුමිය
8. කිංස්ලි ප්‍රනාන්දු මැතිතුමා
9. ජී. එස්. එදිරිසිංහ මැතිතුමා
10. එම්. සී. වික්‍රමසේකර මැතිතුමා
11. වෛද්‍ය පාලිත අබේකෝන් මැතිතුමා
12. ඩී. අබේසූරිය මැතිතුමා
13. ලෙස්ලි ෂෙල්ටන් දේවේන්ද්‍ර මැතිතුමා

වෙත

සුභාශිංසන පෙරටුවයි!

රජය විසින් ඉදිරිපත් කර ඇති මධ්‍ය කාලීන ආර්ථික සංවර්ධන සැලැස්මෙහි ඉලක්ක ළඟාකර ගැනීමේ ක්‍රියාවලියේදී, පෞද්ගලික අංශයට අවශ්‍ය වන ශ්‍රම සම්පත් පිළිබඳව ද සැලකිලිමත් වෙමින් මහජන අපේක්ෂාවන් සපුරාලීම සඳහා රාජ්‍ය සේවාවන් කාර්යක්ෂම ලෙස සැලසීමේත්, සංවර්ධන ක්‍රියාදාමය පහසුකරලීමේත්, අවශ්‍ය අවස්ථාවන්හි දී නියාමනය කිරීමේත් කාර්යභාරය ඵලදායි ලෙස ඉටු කළ හැකි නිපුණතාවන්ගෙන් හෙබි සේවක පිරිස් රාජ්‍ය සේවයට බඳවා ගැනීමටත්, ඔවුන්ට තෘප්තිමත්ව සේවයේ යෙදවීමට අවශ්‍ය පහසුකම් සැපයීමටත් රජය අපේක්ෂා කරයි.

ඒ අනුව ,

සමස්ත රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශයේ ද සේවා නියුක්තිකයන් තෘප්තිමත්වූත්, අභිප්‍රේරණය වූත්, පිරිසක් බවට පත්කිරීමත්,

තවද මානව සම්පත එක් එක් ක්ෂේත්‍රයන් වෙත යොමු කරවීමේදී ආර්ථිකයේ සිදුවෙමින් පවතින ව්‍යුහාත්මක වෙනස්කම් පිළිබඳව සැලකිලිමත්වීමත්, ජාත්‍යන්තර වශයෙන් ශ්‍රමබලකායේ ඵලදායිතාව ඉහළ නැංවීම මගින් ශ්‍රමික පිරිවැය ශ්‍රී ලංකාවට වාසිදායක ලෙස තරගකාරී මට්ටමකට ගෙන ඒමත්,

තවද ශ්‍රමබල අවශ්‍යතා සපුරා ගැනීමේ දී සමස්ත රාජ්‍ය අංශය හා පෞද්ගලික අංශය අතරත්, රාජ්‍ය අංශය තුළ විවිධ ක්ෂේත්‍ර අතරත් අහිතකර තරගකාරීත්වයක් ඇතිවීම වළක්වාලීමත්,

තවද වඩාත් ඉහළ ඵලදායීතාවයක් හා කාර්යක්ෂමතාවයක් ලබාගැනීමට රාජ්‍ය සේවය මෙහෙයවීමේ අවශ්‍යතාවය මෙන්ම පෞද්ගලික අංශයේ ශ්‍රමබල අවශ්‍යතා සපුරාගැනීමට ඇති බාධා ඉවත් කිරීමේ අවශ්‍යතාවය කෙරෙහි අවධානය යොමු කිරීමත්,

තවද වර්තමානයේ පවතින බඳවා ගැනීම් සහ වැටුප් හා වේතන තීරණය කිරීමේ ක්‍රමවේදය සහ කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් සැපයීම සඳහා ගැළපෙන පරිදි රාජ්‍ය ආයතනවල කාර්ය මණ්ඩල අවශ්‍යතාවය විධිමත් කිරීමේ අවශ්‍යතාවය,

තවද බොහෝ දුරට එක හා සමාන වගකීම් ඉටු කරන්නාවූත්, එක හා සමාන අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම් හිමි වූත් පුද්ගලයන්ට රාජ්‍ය සේවයේත්, රාජ්‍ය සංස්ථා හා රාජ්‍ය බැංකු වැනි අර්ධ රාජ්‍ය අංශයේත් බෙහෙවින් වෙනස් වූ වැටුප් හා පාරිශ්‍රමිකයන් ගෙවීම නිසා ඇති වී තිබෙන විෂමතාවය හා ඒ නිසාම රජයේ දෙපාර්තමේන්තුවලට වෘත්තිකයන් බඳවාගැනීම හා රඳවාගැනීමේ අපහසුතාවයත්,

තවද රජයේ ආර්ථික ප්‍රතිපත්තිය වඩාත් අර්ථවත් ලෙස ක්‍රියාත්මක කරමින් ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය තුළ රාජ්‍ය අංශය සතු කාර්යභාරය කාර්යක්ෂමව ඉටුකරලීම සඳහාත්, වර්තමානයේ හා නුදුරු අනාගතයේ රාජ්‍ය සේවයට අවශ්‍ය කරන කළමනාකරණ, විද්‍යාත්මක සහ තාක්ෂණික ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුම සහිත ප්‍රවීණයන් හා සුවිශේෂී නිපුණතාවයන්ගෙන් හෙබි වෘත්තික පිරිස්වලට අනන්‍ය වූ වැටුප් ක්‍රමයක් හඳුන්වාදීම තුළින් ඔවුන් රාජ්‍ය අංශයට ආකර්ෂණය කර ගැනීම සඳහා සුදුසු විශේෂ ක්‍රමවේදයන් හඳුන්වාදීමේ අවශ්‍යතාවය සහ සේවා නියුක්ති තත්ත්වයන් හි කළයුතු වෙනස්කම් හඳුන්වාදීමත්,

තවද ශ්‍රම බලකාය තුළ දැනට පවතින විරැකියා මට්ටම සහ ජනගහනයේ වයස්ගතවීම ද සැලකිල්ලට ගෙන ස්ථිර සේවයට නියමිත සේවා කාලයට අඩු සේවා කාලයක් සේවය කිරීමට කැමති නිපුණතා සහිත ශ්‍රමිකයින් ආකර්ෂණය කර ගනිමින් හා සේවා නියුක්තිය සම්බන්ධයෙන් විකල්ප තත්ත්වයන් නිර්මාණය කරමින් ඵලදායිත්වය හා තරගකාරිත්වය ඉහළ නැංවිය හැකි අර්ධකාලීන හෝ වෙනත් සුදුසු සේවා නියුක්ති ක්‍රමයක් හඳුන්වාදීමත්,

තවද රජයේ පුනරාවර්තන වියදම් ඉතා ඉහළ මට්ටමක පවතින බව සැලකිල්ලට ගනිමින්, ඇතැම් රජයේ ආයතන විසින් වර්තමානයේ ක්‍රියාත්මක කරනු ලබන පාරිතෝෂික දීමනා ඇතුළු විවිධ දිරිගැන්වීමේ ක්‍රම හා ප්‍රදාන ක්‍රම සමාලෝචනයට ලක්කර මූල්‍ය නොවන දිරිකාරකයන් ලබාදීම පිළිබඳව තීරණය කිරීම සඳහා රජයේ අරමුදල් සීමාවන් තුළ ක්‍රියාත්මක කළ හැකි වඩාත් යෝග්‍ය ක්‍රමවේදයන් නිර්දේශ කිරීමත්,

තවද දැනට පවතින වැටුප් හා වේතන, සේවක සංඛ්‍යා හා සේවා තත්ත්වයන්, බඳවා ගැනීම් පටිපාටි, උසස්වීම් පටිපාටි හා සේවා ව්‍යවස්ථා ආශ්‍රිතව පැනනැඟී ඇති මතභේද නිරාකරණය කිරීමත්,

තවද ආර්ථික සංවර්ධනයේ ප්‍රතිලාභ සමස්ත ජන සමාජය වෙත ගලා යෑම තහවුරු කරනු පිණිස වත්මන් සමාජ ආර්ථික හා රාජ්‍ය මූල්‍ය තත්ත්වයන් පිළිබඳව කෙරෙන විද්‍යාත්මක විශ්ලේෂණය මත පදනම්ව සුනිසි අවම වැටුපක්, රැකියා සුරක්ෂිතතාව සහ ඔවුන්ට හිමිවිය යුතු අත්‍යවශ්‍ය සුබසාධක පහසුකම් ලැබෙන බව සහතික කිරීමට යෝග්‍ය ක්‍රමවේදයන් හඳුන්වාදීමත්, කෙරෙහි රජයේ විශේෂ අවධානය යොමු වී ඇති හෙයින් හා ඊට ඉහළම ප්‍රමුඛතාවය ලබාදී ඇති බැවින්,

මෙහි මින්මතු සඳහන් කරනු ලබන ආකාරයෙන්, එනම් :

(අ) සමස්ත රාජ්‍ය සේවයේ එක් එක් ආයතන සඳහා දැනට අනුමත කර ඇති කාර්ය මණ්ඩල යළි සමාලෝචනයට ලක්කොට පළාත් සභා ඇතුළු සමස්ත රාජ්‍ය අංශයේ එක් එක් ආයතන සඳහා ප්‍රශස්ත කාර්ය මණ්ඩලය යෝජනා කිරීම.

(ආ) රාජ්‍ය සේවයේ ඵලදායිත්වය ඉහළ නංවමින් ඉලක්ක අභිමතාර්ථයන් ඉටු කර ගත හැකි පරිද්දෙන් හා ඒවා ඇගයීමකට ලක්කළ හැකි ලෙසින් කළමනාකරණ විධික්‍රමය හා පරිපාලන රටාව නව පරිවර්තනයකට ලක් කිරීමට අවශ්‍ය ක්‍රමවේදයක් සකස් කිරීම.

(ඇ) යහපාලන සංකල්පය මත පදනම් වූ වත්මන් සුවිශේෂී ආර්ථික සංවර්ධන ප්‍රවාහයට උචිත වනසේ රාජ්‍ය අංශයේ වැටුප්, වේතන, වාර්ෂික ප්‍රසාද දීමනා, වෙනත් විවිධ දිරි කාරක (ඵලදායි තත්ත්ව කව දීමනා ආදී) තීරණය කිරීමේ හා සකස් කිරීමේ නව්‍ය ක්‍රමවේදයක් සකස් කිරීම.

(ඈ) ඉහත පූර්විකාවේ සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කරමින්, පළාත් රාජ්‍ය සේවය ඇතුළු රාජ්‍ය සේවයද; රාජ්‍ය සංස්ථා, රාජ්‍ය ව්‍යවසායයන් හා ව්‍යවස්ථාපිත මණ්ඩල ඇතුළු අර්ධ රාජ්‍ය අංශයද; ශ්‍රී ලංකා මහ බැංකුව සහ රාජ්‍ය බැංකු ක්ෂේත්‍රයේද; සන්නද්ධ සේවාවන්; විශ්වවිද්‍යාල හා සිය කාර්ය මණ්ඩලයේ වැටුප් හා පාරිශ්‍රමික පිරිවැය ඒකාබද්ධ අරමුදලට වැය බරක් ලෙස සැලකිය යුතු බවට නීතියෙන් ප්‍රතිපාදන සලසා ඇති සුවිශේෂී ආයතන ද; සඳහා යෝග්‍ය වැටුප් හා වේතන ව්‍යුහයක් හඳුන්වාදීම සඳහා සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම.

(ඉ) ඉහත (ඈ) හි සඳහන් ආයතනද ඇතුළත් වන සමස්ත රාජ්‍ය අංශය කෙරෙහිත් පෞද්ගලික අංශය කෙරෙහිත් ශ්‍රම සම්පත යොමු කිරීමේදී ඇතිවිය හැකි අහිතකර තරගකාරිත්වය වැළැක්වීම සඳහා යෝග්‍ය වූ ජාතික වැටුප් ප්‍රතිපත්තියක් නිර්දේශ කිරීම.

(ඊ) උක්ත (ඉ) හි සඳහන් පරිදි ජාතික වැටුප් ප්‍රතිපත්තියක් සකස් කොට ක්‍රියාත්මක කරන තෙක්, මීට පෙර පැවති වැටුප් කොමිෂන් සභා නිර්දේශ අනුව හෝ අංක 06/2006 හා 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ සහ අංක 30 දරණ කළමනාකරණ සේවා චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීමේ දී හඳුනාගෙන ඇති වැටුප්, කාර්ය මණ්ඩල හා සේවා ව්‍යවස්ථාවන්ට අදාළ ගැටලු මෙන්ම කරනු ලැබ ඇති වැටුප් වැඩිකිරීම් නිසාවෙන් දැනට පැන නැගී ඇතැයි හඳුනා ගනු ලබන වැටුප් විෂමතාවන් අවම කිරීමට අවස්ථාවෝචිත පරිදි අවශ්‍ය පියවර ගැනීම හා බේරුම්කරුවකු ලෙස ක්‍රියා කිරීම. එහිදී සෑම විටම ඉදිරියේදී සකස් කරනු ලබන ජාතික වැටුප් ප්‍රතිපත්තිය ඉලක්ක කර ගනිමින් විසඳුම් ලබාදීමට කටයුතු කිරීම.

(උ) රාජ්‍ය සේවයේ වරින් වර සිදුවන වැටුප් වැඩිවීම් වලට අනුගාමී ලෙස විශ්‍රාම වැටුප් ගෙවීමේදී හෝ විශ්‍රාම වැටුප් පරිවර්තනයන් සිදු කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රමවේදය සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම.

(ඌ) රාජ්‍ය සේවාව සඳහා දායක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට ක්‍රමවේදයක් සකස් කිරීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවක් (මෙහි මින්මතු කොමිෂන් සභාව යනුවෙන් හඳුන්වනු ලබන) ස්ථාපනය කරලීම රජයේ අපේක්ෂාව වන හෙයින් ද,

ඉහතින් හඳුනාගෙන ඇති පරිදි, තත් කොමිෂන් සභාව වෙත පවරනු ලබන කාර්යයන් හා වගකීම් සපුරාලීම මහජන සුබසිද්ධිය උදෙසා වහාම ආරම්භ විය යුතුයැයි මා අදහස් කරන හෙයින් ද,

ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මම, පූර්වෝක්ත කාර්යයන් හා වගකීම් භාරගෙන ඉටුකරලනු පිණිස 2019 මාර්තු මස 25 වන දින සිට වසර 02ක කාලසීමාවක් සඳහා ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වැනි ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ විධිවිධාන අනුව මෙයින් පිහිටුවමි.

තවද, ඔබතුමන්ලාගේ විචක්ෂණභාවය, සාමාර්ථ්‍යය සහ විශ්වාසවන්තභාවය කෙරෙහි දැඩි විශ්වාසයෙන් යුතුව මෙමගින් පෙරකී,

1. එස්. රනුග්ගේ මැතිතුමා
2. සී.පී. සිරිවර්ධන මැතිතුමා
3. දමිතා ද සොයිසා මැතිතුමිය
4. ලලිත් කන්නන්ගර මැතිතුමා
5. ජනක සුගතදාස මැතිතුමා
6. චිත්‍රාංගනී වාගීස්වර මැතිතුමිය
7. චන්ද්‍රාණි සේනාරත්න මැතිතුමිය
8. කිංස්ලි ප්‍රනාන්දු මැතිතුමා
9. ජී. එස්. එදිරිසිංහ මැතිතුමා
10. එම්.සී. වික්‍රමසේකර මැතිතුමා
11. වෛද්‍ය පාලිත අබේකෝන් මැතිතුමා
12. ඩී. අබේසූරිය මැතිතුමා
13. ලෙස්ලි ෂෙල්ටන් දේවේන්ද්‍ර මැතිතුමා

වන ඔබතුමන්ලා ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ සාමාජිකයින් වශයෙන් මවිසින් මෙයින් පත්කරනු ලබන අතර, ඉහත (අ) සිට (ඌ) දක්වා වන කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය විය හැකි සියලුම පියවර ගන්නා මෙන් මම ඔබට මෙයින් විධානය කරමි.

තවද, එස්. රනුග්ගේ මැතිතුමා ඉහත කොමිෂන් සභාවේ සභාපති වශයෙන් ද අනුර ජයවික්‍රම මැතිතුමා කොමිෂන් සභාවේ ලේකම් වශයෙන් ද මම මෙයින් පත්කරමි.

තවද, මෙයින් පවරනු ලබන කර්තව්‍යයන් ඉටුකරලීමට අදාළව අවශ්‍ය විය හැකි පරිදි පරීක්ෂණ කිරීම සහ කරුණු විමර්ශනය කිරීම පිණිස උපදෙස් නිකුත් කිරීමට කොමිෂන් සභාව වෙත මම මෙයින් බලය පවරමි.

තවද, කොමිෂන් සභාව විසින් උපදෙස් නිකුත් කරනු ලැබිය හැකි නැතහොත් තොරතුරු ලබාගනු පිණිස සහාය ඉල්ලා සිටිය හැකි සියලුම රජයේ නිලධරයන් හා එබඳු සෙසු තැනැත්තන් විසින් එම කාර්යය සම්බන්ධයෙන් නිසි අයුරින් පිළිපැදිය හැකි එබඳු උපදෙස්වලට අනුකූලව ක්‍රියාකළ යුතුයැයිද, ලබාදිය හැකි සියලුම සහාය සැලසිය යුතු යැයිද, සැපයිය හැකි සියලුම තොරතුරු ලබාදිය යුතු යැයි ද මම මෙයින් සියලුම රජයේ නිලධරයන්ට සහ සෙසු තැනැත්තන්ට නියම කොට විධාන කරමි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාව ප්‍රකාරව 2016.03.03 දිනැති ජනාධිපති විධානය මගින් පිහිටුවන ලද ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව 2019 මාර්තු මස 24 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි අහෝසි කරමි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය මුද්‍රාව යටතේ වර්ෂ දෙදහස් දහනවයක් වූ මාර්තු මස දහ අට වැනි දින කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි,

**උදය ආර්. සෙනෙවිරත්න,**
ජනාධිපති ලේකම්.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.